රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:- 218

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1983.04.12 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## විනයානුකූල කටයුතු හා ආයතන සංග්‍රහය.

ආයතන සංග්‍රහයේ විධිවිධාන හා විනයානුකූල හා ආයතනික කටයුතු පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ අනුගමනය නොකිරීමේ අවස්ථා නැවත නැවතත් පැනනැගී ඇති හෙයින්, සුපරීක්ෂාකාරීව අනුගමනය කිරීමට/දැනගැනීමට පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

වැඩ තහනම් කිරීම. 2. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 21 ඡේදය මෙසේය:-

" පහත සඳහන් අවස්ථාවලදී, එනම්:-

ඔප්පු වුවහොත් සේවයෙන් පහකිරීමට තරම් බරපතල වූ චෝදනා පිට නිලධරයකුට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමට නැතහොත් අධිකරණ අපරාධ නඩුවක් පැවරීමට ආරම්භ කොට හෝ ආරම්භ කිරීමට සූදානම් ව සිටින විට; හෝ

19:2 වැනි වගන්තියේ ප්‍රකාර නිසි විනය බලධරයා විසින් සලකා බලනු ලැබීමෙන් පසු නිලධරයා සේවයෙන් පහකිරීමට තරම් හේතුවන බරපතල වූ කරුණක් සම්බන්ධයෙන් උසාවියකින් හෝ වගවිය යුතු බලධරයකුගෙන් 19:1 වැනි වගන්තියේ ප්‍රකාර වාර්තාවක් ලැබී ඇති විට, නැතහොත් 18:1 වැනි වගන්තියේ ප්‍රකාර වරදක් කර තිබෙන බව එළිදරව් වී ඇති විට, සහ ඒ නිලධරයාට ස්වකීය නිලයට අයත් රාජකාරි කටයුතු කර ගෙන යාමට ඉඩදීම ප්‍රයෝජනවත් නොවේ යයි හැඟී යන්නේ නම් එසැනින් ඒ නිලධරයාගේ වැඩ තහනම් කිරීමට විනය බලධරයාට පුළුවන."

එහෙත් අවාසනාවකට මෙන්, වැඩ තහනම් කිරීම යුක්තිමත් වීමට අවශ්‍ය වන කරුණු නියමකම සංයෝගය ගැන සැලකිල්ලක් නොමැතිව වැඩ තහනම් කර ඇති අවස්ථා ඉතා අධිකය. මෙපරිදි වැඩ තහනම් කිරීමේ බලය ප්‍රදානය කර තිබීම කාලෝචිත හා විද්‍යමාන එකක් වශයෙන් යොදා ඇත. එහෙත් ඒ බලය වැරදි ලෙස පාවිච්චි කළ විට එයින් නිලධරයාටත්, දෙපාර්තමේන්තුවටත්, රජයේ මූල්‍ය හා අනෙකුත් අරමුණු වලටත් බලවත් හානියක් සිදු වේ. එපමණක් ද නොව, වැරදි ලෙස වැඩ තහනම් කිරීම නියෝග කරන නිලධරයාගේ තීරණ ශක්තියේ දුර්වලතාවයට ද දෙස් දෙන්නකි.

2......

**පරීක්ෂණ කඩිනම් කිරීම.**

3. නිලධරයෙකු වැඩ තහනම් කිරීමකට යටත් වී සිටින අවස්ථා පිළිබඳව විශේෂයෙන්ම සැලකිලිමත් වෙමින්, විනයානුකූල කටයුතු වලදී සියළුම පියවර හැකිතාක් ඉක්මනින් නිම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

**රීති පිළිබඳ දැනුම.**

4. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද ආයතන සංග්‍රහයේ ද විනයානුකූල පාලනය පිළිබඳව වන විධිවිධානයන්ද ගැන සෑම නිලධරයෙකුම, විශේෂයෙන්ම විනයානුකූල කටයුතු පිළිබඳව නිරත වන නිලධරයෙකු දැන සිටිය යුතුමය. දැන් බලපවත්නේ 1981 අප්‍රේල් මස 08 දාතමින් නිකුත් කළ, ආයතන සංග්‍රහයේ xlvii සහ xlviii යන පරිච්ඡේද බවද, වරද වර්ගීකරණය (xlviii පරිච්ඡේදයේ උපලේඛන "අ" "ආ" බලනු මැනවි) කලින් පැවති වර්ගීකරණයට වඩා වෙනස් වන බවද විශේෂයෙන්ම සටහන් කර ගත යුතුය.

**අභියාචනා ඉදිරිපත් කිරීම.**

5. දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු, විනය නියෝගයකට විරුද්ධව ඇති අභියාචනයක් පිළිබඳ වාර්තාවක් එම අභියාචනය ලැබී සති තුනක් ඇතුළත අදාල අමාත්‍යාංශයේ ලේකම්ට ඉදිරිපත් කළයුතුය. අමාත්‍යාංශයේ ලේකම්, අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ එම සභාවේ කමිටුවකට හෝ තම නිර්දේශය ද සමග අභියාචනය ලැබී සති 3 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට ඔහු අපොහොසත් වන්නේ නම්, ප්‍රමාදයට හේතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවට හෝ එම සභාවේ කමිටුවට හෝ දන්වා සිටිය යුතුය.

**රා.සේ.කො. ලේකම්ට යවන ලිපි මත අත්සන.**

6. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම පිණිස වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට යවන ලිපි, පෞද්ගලිකව අමාත්‍යාංශයේ ලේකම් හෝ/අමාත්‍යාංශයක් යටතේ නොවන දෙපාර්තමේන්තුවක නම් එහි ප්‍රධානියා හෝ අත්සන් කළයුතුය. රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට අදහස් කෙරෙන, දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු ගේ අත්සන අවශ්‍ය සෑම ලියවිල්ලක්ම පෞද්ගලිකව දෙපාර්තමේන්තු ප්‍රධානියා අත්සන් කළයුතුය.

**සේවයෙන් පහකිරීමට සානුකම්පික විකල්පයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම.**

7. ආයතන සංග්‍රහයේ xlviii පරිච්ඡේදයේ 16:6 ඡේදයේ විධිවිධාන මෙසේය:-

> "සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පික විකල්පයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීමේ නියෝගයක් කිරීමට අමාත්‍ය මණ්ඩලයට සහ කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාවේ කමිටුවකට හැර වෙනත් විනය බලධරයකුට බලය නැත. මේ වනාහි අභියාචන බලධරයා සතු විශේෂ අයිතිවාසිකමකි. එබඳු නියෝගයක් කළ යුතුදැයි සළකා බැලිය යුත්තේ විටි වූ පරිදි අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබුවහොත් එබඳු අවස්ථාවකදී සහ සාමාන්‍ය රීතියක් වශයෙන් දීර්ඝ වූ ද ප්‍රශංසනීය වූද පූර්ව වාර්තාවක් ඇති නිලධරයකු සම්බන්ධයෙනි."

එවැනි නියම සේවයෙන් පහකිරීමට සාපුතම්පිත විකල්පයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම නියෝග කිරීමට ඇමතිවරයෙකුට හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුට හෝ බලයක් නැත.

**විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 ඡේදය යටතේ විශ්‍රාම ගැන්වීම.**

8. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 ඡේදය යටතේ විශ්‍රාම ගැන්වීමට රජයේ නිලධරයෙකුට අවසර දී ඇති නැති අවස්ථාවන්හිදී, විශේෂයෙන් සටහන අවස්ථාවේදී මාර්ගෝපදේශ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ට ඉදිරිපත් කළයුතුය. ඒ පිළිබඳ කටයුතු කිරීමට බලය ඇත්තේ ඔහුට පමණි. එවැනි නිලධරයෙකුට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය හැකි වන හෝ ප්‍රදානය කරනු ලබන හෝ තිබියහැකි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක් හෝ වෙනත් දීමනාවක් හෝ නොගෙවා සිටීමට හෝ අඩු කිරීමට හෝ වෙනත් නියෝග කිරීමට ඔහුට බලය ඇති අතර, ආයතන සංග්‍රහයේ විස්තර කර ඇති නිතියේ අනුවමත් පැනවීමේ නියෝගයක් දීමට ඔහුට බලය ඇත.

**විශ්‍රාම වැටුප් ගණන් බැලීම.**

9. තනතුර අත්හැර ගිය නිලධරයෙකුගෙන් හෝ සේවයෙන් පහකරන ලද නිලධරයෙකුගෙන් හෝ ලත් අභියාචනයක් මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඔහු සේවයෙන් පහ කිරීමට සාපුතම්පිත විකල්පයක් වශයෙන් අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම නියෝග කළ විට, විශ්‍රාම වැටුප ගණන් බැලිය යුතු වන්නේ තනතුර අත්හැර ගියා සේ සැලකූ දිනයේ හෝ සේවයෙන් පහකරන ලද දිනයේ හෝ එම නිලධරයා ලබාගත් වැටුප මතය.

**විදේශ නිවාඩු.**

10. 1980.05.24 දින සා. අං. 344 දරණ ආයතන චක්‍රලේඛය යටතේ ඉල්ලීමක් මත, විශේෂයෙන්ම රැකියාවක් ලබාගැනීම පිණිස, විදේශගත වූ නිලධරයෙකු තනතුර අත්හැර යාමේ නියෝග පමිණවීමෙන් අභියාචනා ඉදිරිපත් කර ඇති බොහෝ අවස්ථාවල, නියමිත අවසරයක් නොමැතිව වුවද නිවාඩු සඳහා අනුමතිය ලබා ගැනීමටත්, නිවාඩුවකට අත්සන් කිරීමටත් ප්‍රථම විදේශගතවීමට නිලධරයාට සිදුවී තිබෙන්නේ තමාගේ ඉල්ලීම, අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව සලකා බැලීමේ දී සිදුවිය හැකි ප්‍රමාද හේතු කොටගෙන බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවට වැටහී ගොස් ඇත. මෙවැනි ඉල්ලීම් පිළිබඳව අප්‍රමාදව කටයුතු කළ යුතුය.

**අයාලු සටහන් ලේඛනයේ ඇතුලත් කිරීම.**

11. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිලධරයෙකුට ගෙවිය හැකි වන හෝ ප්‍රදානය කරනු ලබන හෝ තිබියහැකි විශ්‍රාම වැටුපක්, පාරිතෝෂිකයක්, හෝ වෙනත් දීමනාවක් මුළුමනින්ම නොගෙවා සිටීමට විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 12 වැනි ඡේදය යටතේ, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් නියෝග කළ විටක, එවැනි නිලධරයෙකුගේ නම "රජයේ සේවයෙන් පහකරන ලද, නැවත තිබිම දෙපාර්තමේන්තුවක සේවයට බඳවා නොගතයුතු නිලධරයන් පිළිබඳ විස්තර ලේඛනයේ" ඇතුලත් කිරීම පිණිස ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 8 වැනි ඡේදය යටතේ වාර්තා කළ යුතුය.

**සාක්ෂිකරුවන්ගේ ලැයිස්තු.**

12. ආයතන සංග්‍රහයේ x1_v111 පරිච්ඡේදයේ 10 වැනි ඡේදයේ සඳහන් චෝදනා පත්‍රයේ 10:2 ඡේදයේ සඳහන්කර ඇති කරුණු හා විස්තර වලට අමතරව, පරීක්ෂණයේදී සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩ ඇති සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ද ඇතුළත් කළයුතුය.

**ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමට අවසර.**

13. පැමිණිලි මෙන්ම විත්තියේ පක්ෂයට ද ලිඛිතව තම කරුණු ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය.

14. පරීක්ෂණ මණ්ඩලයට එය පත්කරන ලිපියක් සමගම "අ" ඇමුණුමේ පිටපතක් ද යැවීමට කරුණාකර සටහන් කර ගන්න.

Siriwardhane

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

"අ" ඇමුණුම.

## විනයානුකූල පරීක්ෂණ.

1. නිලධාරියෙකු වැඩ තහනම් කිරීමකට යටත් වී සිටින අවස්ථා පිළිබඳව විශේෂයෙන්ම සැලකිලිමත් වෙමින් විනයානුකූල කටයුතු වලදී සියලුම පියවර හැකිතාක් ඉක්මනින් නිම කිරීමට සෑම උත්සාහයක්ම ගත යුතුය.

2. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද, ආයතන සංග්‍රහයේ ද විනයානුකූල පාලනය පිළිබඳව වන විධිවිධානයන් ගැන සෑම නිලධාරියෙකුම, විශේෂයෙන්ම විනයානුකූල් කටයුතු පිළිබඳව නිරත වන නිලධාරියෙකු දැන සිටිය යුතුමය. දැන් බලපවත්නේ 1981 අප්‍රේල් මස 08 දාතමින් නිකුත් කළ ආයතන සංග්‍රහයේ x1_v11 සහ x1_v111 පරිච්ඡේද බවද, වරද වර්ගීකරණය x1_v111 පරිච්ඡේදයේ (උපලේඛනය "අ" "ආ" බලනු මැනවි) කලින් පැවති වර්ගීකරණයට වඩා වෙනස් වන බවද විශේෂයෙන්ම සටහන්කර ගත යුතුය.

3. ආයතන සංග්‍රහයේ x1_v111 පරිච්ඡේදයේ 10 වැනි ඡේදයේ සඳහන් චෝදනා පත්‍රයේ 10:2 ඡේදයේ සඳහන් කර ඇති කරුණු හා විස්තර වලට අමතරව පරීක්ෂණයේ දී සාක්ෂි ඉදිරිපත් කිරීමට ඉඩ ඇති සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ද ඇතුළත් කළයුතුය.

4. පැමිණිලි මෙන්ම විත්තියේ පක්ෂයට ද ලිඛිතව තම කරුණු ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය.